# මාධ්‍ය නිවේදනය

ஊடக வெளியீடு | MEDIA RELEASE

**බලශක්ති අමාත්‍යාංශය | வலுசக்தி அமைச்சு | MINISTRY OF ENERGY**

අංක 437, ගාලු පාර, කොළඹ 03.

இல 437, காலி வீதி, கொழும்பு 03. | No 437, Galle Road, Colombo 03.

දුරකථන தொலைபேசி இலக்கம் Telphone: 0112574922 | ෆැක්ස් தொலைநகல் Fax: 0112574742 | විද්‍යුත් තැපෑල மின்னஞ்சல் E-mail: mediamope@gmail.com


2026.03.14

## ඉන්ධන නිකුත් කිරීම සඳහා ජාතික ඉන්ධන අවසර පද්ධතිය (QR Code) ක්‍රියාත්මක කිරීම

මැදපෙරදිග ඇතිවී තිබෙන යුද්මය තත්වය නිසා දිනෙන් දින ඉන්ධන සැපයුම් මාර්ග අඩපණ වෙමින් තිබීමත් රට තුළ ඉන්ධන ඉල්ලුම අසාමාන්‍ය ලෙස ඉහළ යමින් තිබීමත් හේතුවෙන් අප සතුව පවතින තෙල් සංචිත රටේ ආර්ථික කටයුතු පවත්වාගෙන යාමට ප්‍රවේශම්කාරී ලෙස කළමනාකරණය කළ යුතුව ඇත.

වර්ධනය වී ඇති අසාමාන්‍ය ඉල්ලුමට ප්‍රධාන හේතුව වශයෙන් ඇතැම් පිරිස් විසින් අනීතික ලෙස ඉන්ධන තොග රැස් කිරීමේ ජාවාරම්වල නිරත වීම හඳුනා ගනු ලැබ තිබේ. එබැවින්, ජාවාරම්කරුවන්ගේ මෙම ක්‍රියාවන් මැඩපවත්වමින් සාමාන්‍ය ජන ජීවිතය සහ රටේ ආර්ථික කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාම තහවුරු කිරීම රජයේ අපේක්ෂාවයි.

ඒ අනුව, **2026.03.15** දින උදැසන 6.00 සිට බලපැවැත්වෙන පරිදි ඉන්ධන මිල දී ගැනීම සඳහා QR කේත ක්‍රමය බලාත්මක කරනු ලැබේ.
**2026.03.15** දින උදැසන 6.00 සිට QR කේතය නොමැතිව කිසිදු ඉන්ධන පිරවුම්හලකින් ඉන්ධන නිකුත් කරනු නොලැබේ.

QR කේතය ලබාගන්නා ආකාරය:

1. පෙර QR කේතය ලියාපදිංචි කළ අය:

   i. වාහනයේ හිමිකාරිත්වය හෝ දුරකථන අංකය වෙනස් වී නොමැති නම්, 2026.03.14 මධ්‍යම රාත්‍රියේ සිට https://fuelpass.gov.lk/ වෙබ් අඩවියෙන් ඔබට හිමි කේතය භාගත (Download) කරගත හැකිය.

   ii. වාහනයේ හිමිකාරිත්වය හෝ දුරකථන අංකය වෙනස් වී ඇති නම්, 2026.03.15 දින උදැසන 6.00 සිට https://fuelpass.gov.lk/ වෙබ් අඩවියෙන් ඔබ නැවත ලියාපදිංචි විය යුතුය.

2. පෙර QR කේතය ලියාපදිංචි නොකළ සහ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ (RMV) අලුතින්ම ලියාපදිංචි කරන ලද වාහන:

   i. 2026.03.15 දින උදැසන 6.00 සිට https://fuelpass.gov.lk/ වෙබ් අඩවියෙන් ඔබ ලියාපදිංචි විය යුතුය.

එක් එක් වාහන කාණ්ඩ සඳහා සතියකට ඉන්ධන ලබාදෙන ඉන්ධන ලීටර ප්‍රමාණ ඇමුණුමේ සඳහන් ව ඇත.

රටේ නිෂ්පාදන කාර්යයන් හා අත්‍යවශ්‍ය සේවා පවත්වාගැනීමට අවශ්‍ය වන රථවාහන සේවා සඳහා අදාල ආයතන එක්ව විශේෂ ක්‍රමවේදයක් යටතේ ඉන්ධන නිකුත් කිරීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කෙරේ.

ශාන් මොහොමඩ්
මාධ්‍ය ලේකම්,
බලශක්ති අමාත්‍යාංශය.